# 3 අල්-අඛ්ලාක් වස් සුලුක්

ඉස්ලාමිය ජිවන ක්‍රමය මිනිස් සමාජයේ යහපත තකා අල්ලාහ් විසින් සම්පාදනය කරන ලද්දකි. එය විනයෙන් හා හැදියාවෙන් පෝෂණය කර ඇත. එය මෙලොව. පරලොව යන දෙලොවෙහිම මිනිස් සමාජයේ ජයග්‍රහණය පතා අල්ලාහ් විසින් නිර්මානය කරන ලද ජීවන ක්‍රමයකි.

විශ්වාසකර යහපත් දෑ ඉටු කරන මුස්ලිම්, මුඃමින් යයි හැඳින්වේ. "යහපත් ගතිගුණ ඇත්තා ඊමානයෙන් පරිපුර්ණ වුවෙකි" යි නබි (සල්) තුමාණන් පැවසුහ.

"ඔබගෙන් උතුම් ගතිගුණ ඇත්තා යහපත් උසස් තැනැත්තා වේ" යැයි නබි (සල්) තුමාණන් පවසා ඇත.

යහපත් ගතිගුණ ලබා ඇත්තාගේ සිතුවිලි ද යහපත් වේ. ඔහුගේ ක්‍රියාවන් ද යහපත් වේ. සියලු ආගම් විනය හා ගතිගුණ අගය කරයි. විනය වනාහි විධිමත් මෙලොව ජිවිතයකට මෙන්ම පරමාන්තයේ ජයග්‍රහණයටද අවශ්‍ය වන්නේ ය.

"මාව උසස් ගතිගුණ සම්පුර්ණ කිරිම සඳහා යවනු ලැබීය." (මුවත්තා) අල්ලාහ් හා පරමාන්තය විශ්වාස කළ මුස්ලිම්වරු අල්ලාහ්ට බියවීමේන් ජිවත් වන්නෝය. යම් කාර්යයක් කිරිමට පෙර අල්ලාහ්ගේ නාමයෙන් එය ආරම්භ කරති. අල්ලාහ්ගේ නාමය පැවසු විට, මුඃමින් වරයෙකුගේ හදවත භිතියෙන් වෙව්ලයි. අල්ලාහ්ගේ වචනයන් කියවන විට ඊමානය වර්ධනය වේ. ඔවුන් සියලු දෑ වෙනුවෙන් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබති." (අල්කුර්ආනය 8:2)

නියමිත වේලාවෙහි නැමදිම, සකාතය ලබාදීම, භාරකාරත්වය හා පොරොන්දුව ඉටු කිරිම, පතිවත සුරැකිම, අකටයුතුවල නිරත නොවීම යන දෑ වලින් විශ්වාසවන්තයින් ඈත් වන්නෝය. ඔවුන්ගේ හදවත් පිරිසිදුය. ඔවුන්ගේ වචන සත්‍යය ය ක්‍රියාකාරකම් යහපත්ය.

"හොඳ විනය. හොඳ ගතිගුණයෙහි ප්‍රතිබිම්භය වේ"

යහ ගතිගුණ ඇත්තෝ, විනයවන්තයෝය. ඔවුන්ට ලෝකවාසීන් මෙන් අල්ලාහ් ද ආදරය දක්වයි. අල්ලාහුතආලා සුරතුල් ෆුර්කානයේ මෙසේ පවසයි. "රහ්මාන්ගේ ගැත්තන් පොළොවෙහි ආඩම්බර නොවී නිශ්ශබ්දතාවය හා කීකරු බව යනාදිය පිළිපැද ජිවත් වෙති" මෝඩ මිනිසුන් ඔවුන්ට බැණ වැදුනද ඔවුන් එසේ බැණ නොවැද ඉවසීමෙන් සමාව ලබා දී ගුණ ගරුකව ඔවුන් සමඟ කතාබහ කරති" (අල්කුර්ආන්) (25:63)

ඊමානය ඇත්තා ලැජ්ජාව ඇත්තකි. ඔහු පව් කිරීමට ලැජ්ජා වෙයි. ප්‍රසිද්ධියේ හෝ රහසිගතව විනය විරෝධි කටයුතුවල නිරත නොවෙයි, නොදැනුවත්ව එවැනි දෑ සිදුවුවහොත් අල්ලාහ්ගෙන් එයට සමාව අයැදිමින් සිටි.

"ඊමානයහා ලැජ්ජාව කුළුපඟවු මිත්‍රයන් ය. එකක් අහිමි වු කළ අනෙකද අහිමි වේ" යනුවෙන් රසූල් (සල්) තුමාණන් පැවසුහ. (හාකිම්)

"ලැජ්ජාව නැති තැනැත්තෙකුට නියම මුස්ලිම්වරයෙකු වීමට නොහැකිය. එපමනක් නොව, කවුරුන් ළඟ විනය නැතිද ඔහු අනාථයෙකි" මුඃමින්වරයෙකුව ඔහුගේ කථා විලාශය මගින් හඳුනාගත හැකිවේ.

"අල්ලාහ් හා පරමාන්තය විශ්වාස කළ තැනැත්තකු යහපත් දේ කථා කරන්න. නැතිනම් නිශ්ශබ්දව සිටින්න" ය. රසුල් (සල්) තුමාණන් පවසා ඇත. (බුහාරි - මුස්ලිම්)

“ඔබගේ දත් පිරිසිදු කරගන්න. එය පිරිසිදුබවේ එක් කොටසකි, ඔබේ පිරිසිදුකම ඔබේ ඊමානය විදහා පාන්නෙකි”

“කිනම් හදවතක පාරිශුද්ධත්වය ලැගුම් ගන්නෙහිද, එය ස්වර්ගයෙහි ලැගුම් ගනී” රසූල් (සල්) තුමාණන් පැවසූහ. (තබරානි)

මූඃමින්වරයෙකුගේ හදවත හා එයින් පිටත පාරිශුද්ධව තිබිය යුතුයි. අල්ලාහ් විශ්වාස කළ අය තමාගේ සියළු කටයුතු අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා කරන්නෝය. මෙලොවෙහි සතුට හා ලාභයන් බලාපොරොත්තු නොවෙති. මොවුන් ළඟ මුනාෆික්වරයෙකුගේ ලක්ෂණ දක්නට නොලැබේ.

සහීහ් වූ හදීස් අනුව ශ්‍රේෂ්ඨ පුද්ගලයින්ගේ දුආ ප්‍රාර්ථනාවන් අල්ලාහ් අනුමත කරයි. මේ නිසා උතුම් මිනිස්සුන්ට ගරු කිරීම, ඔවුන්ගේ අණට කීකරුවීම, ඔවුන්ට උදව් උපකාර කිරීම, අවශ්‍ය වූ විටකදී ඔවුන්ව උසුලාගෙන යෑම, ඔවුන්ට කෑම්බීම් සැපයීම යනාදිය හොඳ ගති ගුණයන්ය.

“දරුවන්ට ආදරය නොදක්වන හා වැඩිහිටියන්ට ගෞරවය නොදක්වන තැනැත්තා මාගේ අනුගාමිකයකු නොවේ” (අල්හදීස්)

“පරලොවෙහි මුස්ලිම්වරයෙකුගේ තරාදියෙහි දැකිය හැකි ඉතා බරැති දෙය ඔහුගේ යහපත් ගතිගුණයන්ය” රසූල් (සල්) තුමාණන් පැවසූහ. (අබූදාවූද්)

“මෙලොවෙහි සියළු කටයුතු පරලොවෙහි අල්ලාහ් ඉදිරියේ ඉදිරිපත් කිරීමට ලක් වෙයි. ඒවායින් අල්ලාහ් වෙනුවෙන් පමණක් ඉටුකළ දේ හැර අනෙක් සියළු කාර්යයන් වෙන් කර නිරයට විසිකරනු ලබන්නේය” (බයිහකි)

“පිරිසිදුභාවයෙන් කටයුතු කරනු මැනවි. එයට ඉතා ස්වල්ප වූ යහපත් දෑ ඔබට ප්‍රමාණවත් ය” (අල්හදීස්)

“විශ්වාසය පිළිගෙන යහපත් දෑ කරන්නන් හට පරමාන්තයේදී විශාල ලෙස කුලිය ලැබේ. අල්ලාහ් තමාගේ ගැත්තන්ට කුලියදීම අතින් අති ශ්‍රේෂ්ඨය”

අපිද හොඳ ගතිගුණ වලින් පිරිපුන්ව ජිවත් වෙමු.

යහපත් ගතිගුණ යනු ඊමාන් නැමැති ගසෙහි ඵලදාවන් ය. ගසක් එය ලබා දෙන ඵලදාවන්ගෙන් හඳුන්වනු ලබයි.

අභ්‍යාසය

1. මූඃමින්වරයෙකු සතුව තිබිය යුතු ගුණාංගයන් පහක් ලියන්න.
2. ගතිගුණ ගැන සඳහන් කරන කුර්ආන් වාක්‍යයන් හා හදීසයන් ලියන්න.
3. මෙලොවෙහි කාර්යයන් සියල්ල ඉදිරිපත් කරනු ලබන්නේ කෙලෙසද?
4. ඉස්ලාමීය ජිවන රටාව කුමකින් පෝෂණය වන්නෙහිද?
5. "ඔබගේ දත් පිරිසිදු කරගන්න" මෙම වාක්‍යයෙන් ඔබ තේරුම් ගන්නේ කුමක් ද?

# 3.1 ඊමානීය ලක්ෂණ

දේව තෘප්තිය පතා සමහර විශේෂිත වූ ගුණාංගයන් ජීවිතයෙහි පිළිපැදිය යුතුයි.

## ඊමාන් සහ ඉහ්ලාස් (විශ්වාසය සහ පාරිශුද්ධත්වය)

ඉහ්ලාස් යනු වෙන කිසිම අරමුණක් නැති මිශ්‍ර නොවූ පිරිසිදු චේතනාවයි. එනම් සියළු කාර්යයන් අල්ලාහ්ට යයි සිතා ක්‍රියා කළ යුතුය. එහි වාචිකව පමණක් නොව ආකල්පමය ස්ථිරත්වයක් ද ක්‍රියාවෙහි තිබිය යුතුය.

මිනිසෙකු ඔහුගේ ආකල්ප, වචන, ක්‍රියාකාරකම් යනාදි සියලු දෑ ක්‍රමවත්ව සකසා තමාගේ ජීවිතය හොඳින් හැඩගස්වා ගත යුතු බව ඉස්ලාම් කියා සිටී. සිතුවිල්ල වාචිකවද, ක්‍රියාදාමයෙන්ද පිට කළ හැකිය.

සිතුවිල්ල සීමාව ඉක්මවා යෑමෙන් හදවතද පාලනය කළ නොහැකි වේ. සිතුවිලි පාලනය කර ගැනීම සඳහා යම් යථාර්තයන් ගැන ස්ථිරව විශ්වාස කළ යුතුයි. මිනිසාගේ සියලු කාර්යයන් එම යථාර්තයන්ට අනුකූලව තිබිය යුතු යැයි ඉස්ලාමය බලාපොරොත්තු වේ. විශ්වාසය (ඊමානය) රහිතව කෙරෙන ඕනෑම කාර්යයන් ඵල රහිත වන්නේය.

"අල්ලාහ් වෙනුවෙන් පිරිසිදු චේතනාවෙන් නැමදුම් කරන්න යයි, මට අණ කළ බව ඔබ දේශනා කරන්න" යැයි අල්ලාහ් පවසා ඇත."

"නැමදුම් කිරීම අල්ලාහ්ට පමණක්ම විය යුතුයි. පිරිසිදු චේතනාවෙන් නැමදුමෙහි යෙදෙන්න යයි අල්ලාහ් අණ කර සිටියි" යනු නබි (සල්) තුමා පැවසූහ.

"යම් කෙනෙකු තම දෙවියාට ලැදියාව දක්වන්නෙහිද ඔහු යහපත් දේම කර ඔහුට ආදේශයන් නොකර ඔහුට නැමදුම් කරන්න" 18:110 අල්කුර්ආන්

පිරිසිදු චේතනාවේන් යහපත් දෑ කරන්නවුන්ට සුභාරංචි හිමි වේවා ! නිසි මග පෙන්වන්නෝ ඔවුන්ය. ඔවුන් විසින් අකටයුතු දෑ සියල්ල නැතිවී යන්නේය.

මිනිසා සිතෙහි පිරිසිදු චේතනාව මවාගත යුතුය. එම චේතනාව යම් කාර්යයක් කළ යුතුය. චේතනාව අපිරිසිදු නම්. එම කාර්යය නොකළ යුතුය.
"ඔබ යම් දෙයක් ගැන සිතන විට අල්ලාහ්ට බැති බියවන්න" යයි රසූල් (සල්) තුමාණන් පවසා ඇත. ඕනෑම කටයුත්තකදී එම කටයුත්ත ඉටු කරන්නේ සිතට වහල්විමෙන්ද, අල්ලාහ්ට වහල්වීමෙන්ද යන්න කල්පනාකාරී විය යුතුය."

අපගේ නැමදුම්, දාන මාන, උදව් උපකාර යනාදිය අල්ලාහ්ගේ තෘප්තිය පතා කරන්නෙමුද? මිනිසුන්ගේ ප්‍රශංසාව පතා කරන්නේමුද යන්න ගැන කල්පනාකාරි විය යුතුයි. මිනිසුන්ගේ ප්‍රශංසාව පතා කරන ඕනෑම ක්‍රියාදාමයක් ඵල රහිත වේ. එම නිසා ඊමාන්ධාරි සියළුම දෙනා පිරිසිදු චේතනාවෙන් හොඳ දෑ කර දෙලොවෙහිම ජය ලබා ගනිති.

## මුහාසභා (ස්වයං ඇගයීම)

මුහාසභා යනු ස්වයං ඇගයීමය අල්ලාහ්ගේ තෘප්තිය පතා කෙරෙන කටයුතු ගැන ස්වයං ඇගයීමකට ලක් කිරීම ඉස්ලාම් මුහාසභා යයි සඳහන් කරයි. උදෑසන අවදි වී අල්ලාහ් නැමද එදින කටයුතු සියල්ල අල්ලාහ් වෙනුවෙන්ම කරමි. අප්‍රිය කටයුතුවලින් ඈත්ව සිටිමි යයි සිතෙහි ස්ථාවරත්වයක් තබාගත යුතුය. එපරිදි ක්‍රියා කළ යුතුයි.

රැයෙහි නින්දට පෙර නිදි යහනට වී සිට එදවස තමා විසින් කරනු ලද සියළු කටයුතු ආවර්ජනයට ලක් කළ යුතුයි. කරනු ලැබූ යහපත් දෑ ගැන සිතා අල්ලාහ්ට ස්තුති වන්ත විය යුතුයි. අල්ලාහ් මගින් තහනම් කරන ලද දෑ සිදුවූයේ නම් ඔහුගෙන්ම සමාව අයදිය යුතුයි. හැකිතාක් යහපත් දෑ කිරීමට වග බලා ගත යුතුය.

අප ලෝකයේ ජීවත්ව සිටියදී කළ ක්‍රියාවන් පිළිබඳ පරමාන්තයේ අල්ලාහ් ප්‍රශ්න කරයි යන්න සිතෙහි රඳවාගෙන අප කළ දෑ ගණනයට ලක් කළ යුතුයි.

“යම් කෙනෙකු තම ක්‍රියාවෙන් ගණනයට ලක් කර තම මරණයෙන් පසු ප්‍රයෝජනවත් විය හැකි යමක් කරන්නෙහිද, නුවනැත්තා ඔහුය. යනුවෙන් රසූල් (සල්) තුමාණන් පැවසූහ.

“ඔබ, විමසීමට ලක්වීමට පෙර, ඔබ ඔබවම විමසා ගන්න. ඔබගේ ක්‍රියාවන් කිරා බැලීමට පෙර ඔබම කිරා මැන ගන්න” යැයි උමර් (රලි) තුමා පැවසුවේ ය.

ව්‍යාපාරිකයෙකු තම ගණුදෙනුව සසඳනවා සේ මිනිසා තමා විසින් කරන ලද යහපත් අයහපත් දෑ සසඳා බලා “පවෙන් ” වැළකී යහපත් දෑ පමණක් කළ යුතුය.

**ක්‍රියාකාරකම් :-**

1. මුහාසභාව ගැන ඔබගේ අදහස් දක්වන්න.
2. මුහාසභාව ගැන ඔබ කෙසේද? කවදාද කළ යුත්තේ?
3. මුහාසභාව මගින් ඔබගේ ජිවිතයේ කළ වෙනස්කම් කුමක් ද?

# 3.2 දිව හා අනෙකුත් අවයව සුරකිමු

මෙලොවෙහි අල්ලාහ්ගේ මැවීම අතර මිනිසා ශ්‍රේෂ්ඨ වූ මැවීමක් වන්නේය. මිනිසා මවා ඔහුට නොයෙකුත් අවයවයන් ද ලබාදී නොයෙකුත් කාර්යයන්ට එම අවයවයන් උපයෝගී කිරීමට සැලසුවේය. උතුම් ක්‍රියාකාරකම් මගින් මිනිසා මුස්ලිම් හෝ මුඃමින් යන නාමය ලබයි.

නබි (සල්) තුමාණෝ "යම් කෙනෙකුගේ දිවෙන් හා දැත්වලින් අනිකුත් මුස්ලිම්වරු ආරක්ෂාව ලබන්නෙහිද? ඔහු මුස්ලිම්ය" යනුවෙන් පැවසූහ. තවද "යම් කෙනෙකු අල්ලාහ් තහනම් කළ දෑයින් ඉවත්වන්නේද ඔහු මුහාජිර් (අල්ලාහ් වෙනුවෙන් සියළු දෑ අහිමි කළ) කෙනෙකු වේ." (බුහාරි-මුස්ලිම්) යැයිද පවසා සිටියහ.

යම් කෙනෙකුගේ දෑතින් හා දිවෙන් අන් මුස්ලිම්වරුන්ගේ අයිතීන් උල්ලංඝනයට ලක් නොවන්නේද? තම දිවෙන් තව මුස්ලිම්වරයෙකු ගැන ඕප දූප නොදොඩවන්නේද අන් අයගේ සිත් රිදවනු නොලබන්නේද? හෑල්ලුවට ලක් නොකරනු ලබන්නේද, අගෞරවයට ලක් නොකරන්නේද, ඔහු නියම මුස්ලිම්වරයෙක් වේ.

ඉතා සුපරීක්ෂාකාරීව හැසිරවිය යුතු අවයවයක් වන්නේ දිවය. "දෙවියන්ගේ නාමයෙන් දිවුරමි. මෙම මහ පොළොව මත වැඩි කලක් සිර අඩස්සියෙහි තැබිය යුතු අවයව වන්නේ දිවය. දිව විනා වෙන දෙයක් නොවේ" (තබරානි) යයි රසූල් (සල්) තුමාණන් පවසා ඇත.

විටක අබුදර් (රලි) තුමා රසූල් (සල්) තුමාණන් බැහැ දැක තමාට දේශනා කරන්නැයි ඉල්ලා සිටියේය. එවිට රසූල් (සල්) තුමාණන් "අල්ලාහ්ට කීකරුවන ලෙස මම ඔබට දේශනා කරමි. මන්ද යත්, අල්ලාහ්ට කරන ලෙස ඉල්ලා සිටියේය. එවිට "ඔබ කුර්ආනය පාරායනය කිරීමත් ශ්‍රේෂ්ඨවන්තවූත් හා ශක්තිවන්තවූත් අල්ලාහ් මතක් කිරීමත් පිළිපදිනු. ඔබ එසේ පිළිපදි නම්, එය අහස්තලයෙහි ඔබව මතක් කිරීමට ලක්වන අතර පොළොවෙහි ඔබටම ආලෝකයක් වන්නේය" යයි පවසා සිටියහ. නැවතත් දේශනා කරන ලෙස ඉල්ලා සිටියේය. එවිට රසූල් (සල්) තුමාණන් ඔබ නිශ්ශබ්දතාව රැකගන්න. එය රැකීමෙන් ෂෛතාන් ඔබ වෙතින් ඈතට දිව යයි. එව ඔබේ ආගමික කටයුතුවලට පිටුවහලක් වනු ඇත, යයි ද ප්‍රකාශ කර සිටියහ.

තවත් දේශනා කරන මෙන් ඉල්ලූ විට "ජනයාට තිත්ත වුවද සත්‍යය කතා කරනු" මුව වසා සිටි තැනැත්තා විමෝශනය ලබන්නේය" යයි පවසා සිටියහ.

නැවතත් දේශනා කරන මෙන් ඉල්ලූ විට "අල්ලාහ් වෙනුවෙන් ඔබ කරන කාර්යයන්ට දොස් පවරන්නන්ගේ දොස්වලට භය නොවනු" යයි පැවසූහ. ඉන් අනතුරුව විමසූවිට, "ඔබ ළඟ තිබෙන අඩුලුහුඬුකම් විනා, අනුන්ගේ අඩුලුහුඬුකම් සොයා යෑමෙන් ඔබව වළක්වා ගනු" තවද, උසුරන්නට පහසු වුත් හොඳ නරක කිරා බලනු ලබන තරාදියෙහි ඝනත්වය ගෙන දෙන්නාවූත් දෑ, නිශ්ශබ්දතාව හා යහපත් ගතිගුණය" යි නබි (සල්) තුමාණෝ පැවසූහ.

සත්‍ය කතා කිරීම : අල්ලාහ් හා පරමාන්තය ගැන විශ්වාස කළ මිනිසා හොඳ දෙයක්ම කතා කරන්න, නැතිනම් නිශ්ශබ්දව සිටින්න" (බුහාරි)

අල්ලාහ්ට කීකරුව ජීවත්වන විශ්වාසවන්තයෙක් තමාගේ ජීවිතය හැඩ කිරීමට අවශ්‍ය ගතිගුණ වලින් සත්‍ය කතා කිරීම ඉතාමත් උතුම් ගතිගුණයකි. මෙය මිනිසාව තැන්පත්භාවයට පත්කරන කුසලයකි. අල්ලාහ් කුර්ආනයේ, **"විශ්වාසවන්තයිනි ! ඔබ අල්ලාහ්ට කීකරුවන්න. ඔබ අල්ලාහ්ට බියවන්න, තවද සත්‍යවාදීන් සමගම ඉන්න"** යයි පවසා සිටි. විශ්වාසවන්තයින් ළඟ සත්‍ය, අවංකකම, නිතිගරුක බව ඇති වේ යන්න පැහැදිලිය. සත්‍ය කතා කිරීම විශ්වාසවන්තයෙකුගේ ගතිගුණයක් සේම අසත්‍ය පවසා සිටීම මුනාෆික්වරයෙකුගේ ගතිගුණයකි. **"බොරු කියන්නා විනාශ වන්නේය."** (51:10) ජිවිතයේ සත්‍ය පිළිපැදීම දේවදූතයන්ගේ ගුණයකි. අල්ලාහ් කුර්ආනයේ, "ඔහුගේ දූතයන්ට කීකරු වූ විශ්වාසවන්තයින් පරලොවේ ස්වර්ගයෙහි නබිවරුන්, සත්‍යවාදීන්, විරුවන් සමඟ සිටි" යයි සඳහන් කරයි.

මිනිසාගේ සියලු දුර්චරිතයන්ට පාදක වන්නේ බොරු කිමය. එය **විශ්වාසවන්තයෙකුගේ** හදවත අන්ධකාරයට ලක් කරයි. බොරු දෙඩීම නැවැත්වීම, පව්වලින් නිදහස් වීමට හේතුවේ. **"ඔබ සත්‍යම පිළිපදින්න. එය ඔබව කුසල් පිරි මඟකට යොමු කරයි. එමග ඔබව ස්වර්ගය දක්වා ගෙන යයි."** (අල් කුර්ආනය)

විශ්වාසවන්තයෙක් ඔහු බොරු දොඩවන විට ඊමානය ඇති තැනැත්තෙකු යයි පැවසිය නොහැක. මෙය නබි (සල්) තුමාණන් **"විශ්වාසවන්තයෙකු ලෙස සිටින විටදී, යමෙකු බොරු දොඩවන්නේ නැත"** යයි ප්‍රකාශ කළේය.
අපි එකිනෙකා මුණ ගැසුවිට සලාම් කියා සුභ ප්‍රාර්ථනා කළ යුතුයි. උපකාරයක් කලවිට ජසාකල්ලාහු කෙරා යැයි කිව යුතුයි. අපි කතාකරන දෑ අනුන්ට හිරිහැරයක් නොවන ලෙසත් පාපයක් නොවන ලෙසත් සකසා ගත යුතුය. අප පෞද්ගලික තැනක හෝ පොදු ස්ථානයක කතා කරන දෑ ඉතා සන්සුන්ව පහත් හඬින් පැහැදිලිවද, එසේම ඉස්ලාමයේ රාමුව තුලද කතා කළ යුතුයි.

"අල්ලාහ්ගේ තෘප්තිය පතා යහපත් දෑ මිනිසුන් ඉදිරියේ පවසන්නට බොහෝ ආනිශංස තිබේ. (4:114)

**යමෙකුගේ ඊමානය විධිමත්ව තිබිය යුතු නම්, ඔහුගේ දිව විධිමත් විය යුතුයි. ඔහුගේ දිව විධිමත් නම්, හදවත ද යහපත් වන්නේය.** (අහමද්) රසූල් (සල්) තුමාණන් දිවෙහි ක්‍රියාකාරීත්වය, ඊමානය හා සම්බන්ධ බව එලෙස පෙන්වා දුන්හ.

එපමණක් නොව අන් අවය ප්‍රශංසා කිරීම, සුභ පැතීම, අල්ලාහ්ව ප්‍රශංසා කිරීම වැනි දෑ දිවෙන් සිදුවන්නේය. මුස්ලිම්වරු මුණ ගැසෙන විට සලාම් කියා වැළඳ ගැනීමත්, සුවදුක් විමසීමත් ඉස්ලාමීය හැදියාවන් ලෙස සැලකේ. මෙවන් තැන්වලදී සීමාව නොඉක්මවා යාමට වග බලා ගත යුතුයි. ප්‍රශංසාව හා සුභපැතීම අව්‍යාජ විය යුතුයි. හොඳ දෑ කතා කරන විට මිනිස්සුන් අතර, බැඳීමක් ඇතිවේ. දිව මගින් හොඳ හා නරක සේම විපාකයන් ද ඇති වී, එම විපාක මගින් සමාජයේ නොයෙකුත් බෙදීම් ද ඇතිවන්නට පුළුවන.

පුද්ගල හා සමාජය අතරේ බැඳීම ඉස්ලාම් අනුමත කරන අතර එම බැඳීම බිඳ දමන කාර්යයන් මුලින් උපුටා දැමිය යුතු යයි කියා සිටි. ඒ සඳහා දුර්වචන භාවිතා නොකිරීමද පිළිපැදිය යුතු යයි කියා සිටි. මිනිසා මොනයම් අවස්ථාවක වුවද දුර්වචනයෙන් ඈත්විය යුතු යැයි ඉස්ලාමයේ ප්‍රකාශ කර සිටියි.

**"නබිවරයාණෙනි, ඔබ ඉතා උසස් ගුණාංගයන්ගෙන් පිරිපුන්ය"** යයි නබිතුමාණන්ව ප්‍රශංසාවට ලක් කල අල්ලාහ් එතුමාණන්ගේ ප්‍රචාරයන් කෙසේ විය යුතු දැයි අණ කර ඇත. **"නබිතුමනි, මිනිසුන්ව යහ මගට ආරාධනා කරන විට ඔබ උතුම් විදිහට හැසිරෙන්න. දුර්වචන වලින් ඈත් වන්න.** (අල්කුර්ආනය)

ඉහත සඳහන් අණ අප විසින් සලකා බැලිය යුතුයි. සත්‍ය වශයෙන්ම අප දිව හා මුවෙන් පිටවන අයහපත් දෑ අප සේම අනුන්වත් හිරිහැරයට ලක් කරයි.

නබි (සල්) තුමාණන් **"දිව හා රහස් අවයවයන් ආරක්ෂා කර ගන්නා තැනැත්තාට මම ස්වර්ගය ලබා දෙන්නට පොරොන්දු වෙමි"** මෙම හදිසයෙන් මිනිසෙකු නිරයට හෝ ස්වර්ගයට යෑම රැඳි තිබෙන්නේ මුවින් පිට කරන දේ හා රහස් අවයවයන් වලින් කරන දේ මතය යන්න පැහැදිලි වේ.

හස්රත් අලි (රලි) තුමා මෙසේ ප්‍රකාශ කරයි. “ඔබේ දිව සිංහයෙකු වැනිය. එය නිසියාකරව රැකබලා ගන්නේ නම්, එයින් ඔබට ආරක්‍ෂාව ලැබෙයි. එය මුදාහැරියේ නම්, නුඹව මරා දමයි”

දුර්වචන පාවිච්චි කරන්නා, මිනිසුන් අතර සමච්චලයට ලක්වෙයි. ඔහුගේ ක්‍රියාවන් ගැරහුමට ලක්වෙයි. මිනිසුන් බොරුකාරයෙකු ලෙස ඔහුව හඳුන්වයි. ඔහු සමග දොඩමළු වීමට ද මිනිසුන් බිය වෙති.

මෙමගින් සමාජයේ පැවැත්මටද හානි පමුණුවිය හැකිය.

## අනෙකුත් අවයවයන් සුරකීම

මනස, නෙත්, අත් පා යන අවයවයන්ගෙන් ද පව් සිදුවේ. මනස හා මුවින් සිදුවන පව් බරපතල හා සමාජ විරෝධිය. මිනීමැරුම්, මංකොල්ලකෑම්, සොරකම්, දුරාචාරය, සූදුව, අසත්‍ය, බොරු චෝදනා එල්ල කිරීම යන දෑ අපේ අවයවයන්ගෙන් සිදුවන්නේය. ඕනෑම මිනිසෙකු තමාට පමණක් නොව, අනුන් වෙනුවෙන් ද ජීවත්වන්නේ ය. උපකාර කිරීමට නොහැකි වූවද අනුන්හට හිරිහැරයක් නොවෙන පරිදි ජීවත් විය යුතුයි.

මෙසේ හිරිහැරයන්ට ලක්වීමෙන්, සමාජය කෙළෙසීමට ලක්වේ. හිරිහැර කරන්නාව මිනිසුන් මරා දමන්නට පවා පෙළෙඹෙයි. මෙයින් ජීවිත, මුදල්, කාලවේලාවද නාස්තියට ලක්වේ. රසූල් (සල්) තුමාණන් විටක, “ඔබට උදව්කරන්නාට සේම හිරිහැර කරන්නාටද උදව් කරන්න” යැයි පැවසූහ. එවිට “හිරිහැර කරන්නාට උදව් කරන්නේ කෙසේද” යැයි සහාභාවරුන් ඇසූවිට “ඔහුව පව්න් වැළකීම මගිනි” යන්න පිළිතුර දුන්හ. මේ නිසා අපේ ඊමානය හැඩගස්වා, විශ්වාසවන්ත අන්දමට ජීවත්වීම සියලු දෙනාගේම යුතුකමකි.

අභ්‍යාසය

1. දිව පිළිබඳ සඳහන් වන හදීස් දෙකක් ලියන්න.
2. දිව සුරැකිය යුතුයි පහදන්න.
3. ඊමානය පරිපූර්ණ විය යුතු නම්, කිනම් අවයවයන් යහපත් විය යුතු ද?
4. දුර්වචනයන්ගේ ඵල විපාක කුමක් ද?
5. පුද්ගල හා සමාජ බැඳීම් දිව මගින් ගොඩ නැගෙන්නේ කෙසේ ද?
6. සිර අඩස්සියේ තැබිය යුතු අවයව කුමක් ද?
   එසේ පවසනු ලැබුවේ කිනම් හේතුවෙන් ද?

## 3.3 එදිනෙදා ජීවිතයේදී පිළිපැදිය යුතු ගුණාංගයන්

එක් එක් මිනිසා තම පෞද්ගලික ජීවිතයේ විනයානුකූලව හා බැතියෙන් සිටය යුතු යයි ඉස්ලාමය බලාපොරොත්තු වේ. රසූල් (සල්) තුමාණන් සාමාන්‍ය මිනිසෙකු වුවත්, කරුණාව, දයාව ආකර්ශණීය බව, භක්තිය යන යහ ගුණාංග පිහිටා තිබුණු මිනිසෙකු සේම ගෘහ පාලකයෙකු, සත්‍යවන්ත ව්‍යාපාරිකයෙකු, එඩිතර සෙන්පතියෙකු, අග්‍රගන්‍ය මග පෙන්වන්නෙකු, යුක්ති සහගත රාජ්‍ය නායකයෙකු සේ බැබළුණහ. මුස්ලිම්වරුන් හැසිරිය යුත්තේ ද, මෙලෙස යැයි ඉස්ලාමය පවසා සිටි.

මිනිසා ඔහුගේ සෑම ක්‍රියාවලියකදීම යුක්ති සහගතව කටයුතු කළ යුතුයි. මිනිසෙකු තවත් මිනිසෙකුට ගරු නොකරන්නේ, ඔහු යුක්තිසහගතයෙකු නොවන විටය. වර්තමානයේ නුසුදුස්සෝ උසස් රැකියාවල නියැලි සිටිති. ඔවුන් මනුෂ්‍යත්වයෙන් ක්‍රියා නොකරන නිසා වංචා හා දූෂණ බහුලව දකින්නට ලැබේ. මේවා සමාජ විරෝධී ක්‍රියාවන් ය. "සුදුසු පුද්ගලයෙකු සිටින විට ඔහුව පිටු දැක, නුසුදුසු පුද්ගලයකු යම්කිසි නායකත්වයකට පත්කර ගන්නේ නම් පත්කර ගත් තැනැත්තන්, අල්ලාහ්, ඔහුගේ දූතයා හා මුස්ලිම්වරු යන සියළුම දෙනාටම ද්‍රෝහි වූවෝය. (හාකිම්) (අල් හදීස්)

අල්ලාහ් සැමවිටම අප දෙස නෙත් යොමු කරමින් සිටින නිසා, අප ඔහුගේ අණට කීකරුව ජීවත් විය යුතුයි.

නීතිගරුක පුද්ගලයන්ව අල්ලාහ් ප්‍රිය කරයි. මිනිසා කරුණාව, ආදරය, ඇතිකර ගත් විට ඔහු නීතිගරුක පුද්ගලයෙකු වෙයි. තමා මෙන් අන් අයවද එකසේ සලකයි. තමාට ප්‍රිය දේ අනුන්ටද ප්‍රිය කරයි. අනුන්ටද යුතුකම් ඉටුකර ජීවත්වෙයි.

විශ්වාසවන්තයිනි ! විශ්වාස ද්‍රෝහි නොවන්න, යුක්තිසහගතව නීතිය ඉටුකරන්න, අනුන්ට උදව් උපකාර කරන්න, ඥාතීන්ට සලකන්න යයි අල්ලාහ් අණ කරයි. ඔබ විනය විරෝධි හා තහනම් කළ කටයුතුවල නොයෙදෙන්න. අණට අකීකරු නොවන්න. කෝලාහල නොකරන්න. මේවා ඔබට තහනම් කර ඇත. (අල් කුර්ආන්)

අල්ලස් හා සම්බන්ධ වන සියළු දෙනා නබි තුමාගේ සාපයට ලක් වූවන් වන්නෝය. අල් කුර්ආනයේ, "අනුන්ගේ ද, පැහැර නොගන්න. ඒ පැහැර ගැනීම සඳහා බලධාරීන්ගේ පිහිට නොපතන්න. යම් මිනිසෙකු තමාට අයිති නොවන වස්තුවක් තමාට අයිති යයි ප්‍රකාශ කරන්නේ නම් ඔහු අපගේ කෙනෙකු නොවන්නේ ය. අපායෙහි ඔහුට වෙන් වූ ස්ථානයක් ලබා ගත්තේය," යැයි සඳහන් කර ඇත.

### සත්‍යවන්තභාවය

ඉපැයීම, ගනුදෙනු කිරීම යන කටයුතුවලදී සත්‍යවන්ත විය යුතුයි. යුක්තිසහගත ව්‍යාපාරිකයෙකුට මෙම ගුණය ඉතා වැදගත්ය. නබි (සල්) තුමාණන් මෙම ගුණාංගයන්ගෙන් පිරිපුන් අයෙකු වූහ. දවසක් මෙතුමාණන් ඇඳුමක් මිලදී ගෙන එහි මිලට වඩා යම්කිසි මුදලක් වැඩිපුර දුන්හ. තව දිනක කඩවීදියේ ගමන් කරන විට ධාන්‍ය ගොඩක් දැක එතුලට අත දමා පරීක්ෂා කර බැලූහ. තෙත ස්වරූපයෙන් ධාන්‍ය තිබෙනු දුටු හෙයින් ව්‍යාපාරිකයාට දොස් පැවරූහ.

හලාල් වූ අනුමත ක්‍රමයට ඉපැයීම ප්‍රධාන යුතුකම්වලට දෙවන යුතුකම වේ. වරෙක නබි (සල්) තුමාණන්ගෙන් උසස් ඉපයීම පිළිබඳ ඇසුරට "තම දෑතින් උත්සහ කර උපයගන්නා වස්තුවන් බොරුව, විශ්වාසය, කඩ කිරීම යනාදියෙන් බැහැර වූ වෙළඳාමක් වන්නේය." යැයි පවසා සිටියෝය.

විශ්වාසවන්තයිනි ! අනුන්ගේ දෑ වෙළෙඳාමෙන් හෝ අනුදැනුමෙන් ලබාගන්න. නීති විරෝධි ලෙස ලබා නොගන්න. එසේ සිදු කොට ඔබලා, ඔබලාව විනාශ කර නොගන්න." මුස්ලිම්වරයෙකු සතුව අකටයුතුකම්, විශ්වාස කඩකිරීම්, නිතිවිරෝධි ඉපැයීම්, අයුක්තිය යන ගුණාංග නොතිබිය යුතුයි' යම් කෙනෙකු නිතිවිරෝධිව ඉපැයීමෙහි යෙදෙන්නේ නම්, ඉපැයූ දෑ ද කියාමාවේ තමා සමග ගෙන්වා ගත යුතුයි. (අල් කුර්ආනය 3:161).

රැවටීම, උප්පරවැට්ටි කිරිම යන දෑ අයුක්ති සහගත වේ. මුස්ලිම්වරයෙකු, පොරොන්දු කඩකිරිම, බොරු දිවිරුම් දීම යනාදියෙන් වැළකී සිටිය යුතුයි. "යම් කෙනෙකුගෙන් වැඩක් ලබාගන්නෙහිද ඒ වැඩට සරිලන වැටුපක් ඔහුට ලබා දෙන්න. එසේ නොකරන්නා කියාමාවේ මාගේ සතුරෙක්ය" යනුවෙන් නබි (සල්) තුමාණන් පවසා ඇත.

## ඉවසිලිවන්ත බව

මෙය මිනිසාට අවශ්‍ය උතුම් ගුණාංගයකි. දුක් කරදර විඳ දරා ගැනීම, කරදර නොතකා කුසල්වල යෙදීම, ඉවසිලිවන්තකම වේ. අල්ලාහ් ජීවිතය හා මරණය මිනිසාව පරීක්ෂණයට භාජනය කිරිම සඳහා මැව්වේය. ඔහු තම ගැත්තා භිතියෙන්, බඩගින්නෙන්, වස්තුන්ගෙන්, ජිවින්ගෙන් පිරික්සුමට භාජනය කරයි. මෙම පිරික්සුම විඳ දරාගන්නා මුඃමිවරුන්ට අල්ලාහ් සුභ ප්‍රර්ථනා කරයි, යන්න පවසන ලෙස අල්ලාහ් නබි (සල්) තුමාට අණ කරයි. පිරික්සුම් වලින් අප ඊමානය ආරක්ෂා කිරීමට නම් අපි ඉවසිලිවන්ත විය යුතුයි. දරිද්‍රතාවය, වසන්ගත රෝග, ස්වභාවික ව්‍යසනයන්, ආර්ථික අග හිඟකම්, ජිවිතහානි යනා දී දෑ ජයගැනීමට ඉවසිලිවන්තභාවය අවශ්‍යයයි.

තමාගේ හැඟීම් පාලනය කිරීමටත් ඉවසිලිවන්තභාවය අත්‍යවශ්‍ය වේ. අල්ලාහ් (අස්සව්ම්) උපවාසය අපට අනිවාර්ය කලේ මේ සඳහාය. උපවාසය විඳ දරාගැනිමේ අඩකි. රසුල් (සල්) තුමාණන් පවා යම් කෙනෙකු හට උසස් ජිවන තත්වයක් ලැබී තිබීමද පිරික්සුමක් බවත් එවිට ඔහු සීමාව ඉක්මවා ගොස් භුක්ති විඳිම නොකිරිමට ඔහුට ඉවසිලිවන්තභාවය අත්‍යවශ්‍යය යැයි ප්‍රකාශ කර සිටියහ.

අල්ලාහ්ගේ අණට කීකරුවීමටත් යම් කෙනෙකුට ඉවසිලිවන්තභාවය අවශ්‍යය. කොතරම් දුක් ගැහැට ඇතිවුවද ඒ ඒ අවස්ථාවල ඒ ඒ යුතුකම කිරීමට ඉවසිලිවන්තකම අවශ්‍යයයි.

නිදසුනක් වශයෙන් දැඩි ශිත කාලගුණයක පවා විශ්වාසවන්තයෙක් අල්ලාහ්ගේ අණ පිළිගෙන වුලූඋකර නැමැදුමෙහි යෙදෙන්නේය. මෙය ඉවසිලිවන්ත බවට එක් සාධකයෙකි.

ඉවසිලිවන්තභාවය, මිනිසාට කල්පනාකාරීව වැඩ කිරීමට ඉවහල් වේ. ඔහුට කෝපය ඇති නොවේ. නබි (සල්) තුමාණන්, "නියම වීරයා මල්ලව පොරෙන් ජයග්‍රහණ කරන්නා නොව, කෝපය ඇතිවන විටදී තම හැඟීම් පාලනය කරගන්නා" යැයි පැවසුහ.

ඉවසිලිවන්ත බව අනුගමනය කරන විට එඩිතරකම හා ශුරත්වය වර්ධනය වේ. "සත්‍ය වශයෙන්ම ඉවසිලිවන්තයාට නිමක් නැති භාග්‍යයන් ලබා දෙනු ලැබේ" යයිද "අල්ලාහ් ඉවසිලිවන්තයන් සමග සිටින්නේය" යනුවෙන් ද රසුල් (සල්) තුමාණන් පවසා ඇත. අල්ලාහ් කෙරෙහි විශ්වාසය තැබූ තැනැත්තෙකු ඉස්ලාමය වෙනුවෙන් යුද්ධ කිරීමට ද ශක්තිය ලබන්නේය.

"මිනිසුන්ගෙන් ලැබෙන ගැරහුම් ඉවසා ගෙන ඔවුන් සමගම ජිවත්වන මුස්ලිම් ඉතා උසස් කෙනෙකු වන්නේය." (තිර්මිදි)

රසුල් (සල්) තුමාණන්ට කොතෙකුත්, ගැරහුම්, තරවටු, තර්ජන පැවතියද පූර්ණ ඉවසිලිවන්තභාවයෙන් කටයුතු කළ නිසා එතුමාට ජයග්‍රහණය ලැබිණි. අපිද ඉවසිලිවන්තභාවය පිළිපැද ජයග්‍රහණය ලබමු.

## කීකරුවීම

කීකරුවීම යනු ගෞරව දැක්වීම, යටත්වීම, අවනත වීම යනුවෙන් කිව හැකිය. යටහත්භාවය අපව උසස් කරයි. "අල්ලාහ්ගේ ගැත්තන් පුරසාරම් නොදෙඩවති. පොළවෙහි උඩඟුකමෙන් නොහැසිරෙති. ඔවුන් කීකරුභාවයෙන් කටයුතු කරති." (25-63) යයි කුර්ආනය සඳහන් කරයි.

" ඔබ කීකරුව හැසිරෙන්න, යයි අල්ලාහ් මට වහී පහල කළේය. එය ආක්‍රමණය කිරීමක් දක්වා නොයා යුතුයි. උවමනාවට වඩා පුරසාරම් නොදෙඩිය යුතුය." යයි රසුල් (සල්) තුමාණන් පවසා ඇත. (අබුදාවුද්)

මුහම්මද් (සල්) තුමා නායකයකු නබි වරයෙකු වූහ. එසේ සිටියද ඔහු කිසිම රැකියාවක් ගැරහුමට ලක් නොකළහ. මිනිසෙකුගේ උසස්වීම හා පහත්වීම රැකියාවෙන් නොව ඔහුගේ ගතිගුණ, සත්‍යවන්තභාවය හා කීකරුභාවයෙන් මිස, යන්න නබිතුමාගේ ජීවිතයෙන් පැහැදිලි වන්නේ ය.

ඉස්ලාමයේ නායකත්වය විසින් ගන්නා ලද තීරණයක් අපට කිසියම් විටක අලාභයක් ගෙන දෙන්නක් වුවද සමාජයේ යහපත තකා එම තීරණයන්ට අප හිස නැමිය යුතුයි.

" අල්ලාහ් කුර්ආනයේ කෙනෙකු විශ්වාසකර යහපත් දෙයකම නිරතව අල්ලාහ්ගේ සමාජයේ කීකරුව සිටින්නේ ද ඔවුන් ස්වර්ගස්ත වන්නෝය. සදකාලකිවම එහි ලැඟුම් ගන්නෝය. නියම විශ්වාසවන්තයෙක් පොළොවෙහි කීකරුව හැසිරෙයි. මෝඩ මිනිසුන් ඔවුන් සමඟ මුරණ්ඩු වන විට සලාම් කියා ඉවතලන්නෝය. රෑ කාලයෙහි වතාවත් වල යෙදෙන්නෝය. පරමාන්තයෙහි ස්වර්ගය මවා ඇත්තේ ලෝකයේ ආඩම්බරය. උඩඟුකම වැනි දෑවලින් ඉවත් වී සිටිය අයටය. යහපත් ඉරණම භක්තිවන්තයන්ටය." (අල් කුර්ආනය)

වරෙක උමර් (රලි) තුමා වේදිකාවක (මිම්බර්) නැග, " ජනයාණෙනි ! ඔබ යටහත්ව හැසිරෙන්න. යම් කෙනෙකු යටහත්භාවය පිළිපදින්නේ ද ඔහුගේ තත්ත්වයන් අල්ලාහ් උසස් කරන්නේය. කවරෙකු තමා ගැන පොඩියට සිතා ගෙන සිටිය ද මිනිසුන් හට ඔහු මහා පුද්ගලයෙකු සේ පෙනේ. යම් කෙනෙකු ආඩම්බර වන්නෙහිද මිනිසුන් ඉදිරියේ ඔහු සමච්චලයට පත්වේ යයි නබි (සල්) තුමාණන් පවසා ඇත." යැයි දේශනා කළේය.

තවද " ආයිෂා, කීකරුභාවය පිළිපදින්න. එවිට අල්ලාහ් ගේ ආදරය අපට ලැබේ. ආඩම්බරවන්නන්ව අල්ලාහ් අප්‍රිය කරයි" යයි නබි (සල්) තුමා පවසා ඇත.

මුස්ලිම්වරයෙකු තම ජීවිතයේ පළමුව අල්ලාහ්ටද, ඊළඟට ගුරු දෙගුරුන්ටද, වැඩිහිටියන්ටද කීකරු විය යුතුයි. අල්ලාහ්ගේ අණට කීකරුව, දෙගුරුන්ගේ අණට පිටුනොපා ක්‍රියා කිරීම, පාසලේ විනය රැක ගුරුවරුන්ගේ අණට කීකරුවද හැසිරිය යුතුයි.

## සමාව

සමාවදීම ඉස්ලාම් දේශනා කරන උසස් ගුණාංගයකි. රසුල් (සල්) තුමාණන්ගේ දේශනා හා හැසිරීම් මගින් මෙය අනාවරණය විය. මිනිසෙකු අල්ලාහ්ට කළ වැරදිවලට අල්ලාහ්ගෙන් සමාව අයැදිය යුතුයි. එනමුදු මුස්ලිම්වරයෙකු අන් කෙනෙකුට වරදක් සිදු කරන්නේ නම් ඔහුගෙන්ම සමාව අයැදිය යුතුයි. ඔහු එයට සමානොවන තාක් කල් අල්ලාහ් ද සමාව නොදෙන්නේ ය.

යම් කෙනෙකු අනිසි ලෙස ඝාතනය කරනු ලැබුවද, අසාධාරණයකට ලක්වුවද, එයට පළිගැනීමේ අයිතිය ඝාතනයට ලක්වුවන්ගේ හිමිකාරයාට ද අසාධාරණයට ලක්වූ තැනැත්තාට ද අල් කුර්ආනය මඟින් ලබා දී ඇත. එනමුදු වරදකරුවෙකුට සමාව දීම අල්ලාහ් ප්‍රිය කරන්නේ ය.

"විශ්වාසවන්තයිනි ! ඝාතනයක් වෙනුවෙන් පළිගැනීමට ඔබට හැකිය. එනමුදු ඝාතනයට ලක්වන්නාගේ සහෝදරයන් ඝාතනය කළ තැනැත්තාට සමාව දුන්නේ නම් ඔහුව ඝාතනය නොකර මුදහරින්න." (2:178) මෙසේ අල් කුර්ආනය සඳහන් කරයි.

රසූල් (සල්) තුමාණන් තමාට වස මිශ්‍ර කරදුන් යුදෙව් ගැහැණියටද සමාව දුන්හ. තවද, තමාගේ මස්ජිදයෙහි මුත්‍රා කළ දුර බැහැර අරාබි ජාතිකයෙකුටද සමාව දුන්හ.

හිජ්රි 8 වන වසරේ මක්කා ජයග්‍රහණය ලැබූ අවස්ථාවේ ඉස්ලාම් විරුද්ධවාදීන් අත්අඩංගුවට ගනු ලැබූහ. මොවුන් අතුරින් නබි (සල්) තුමන්ගේ බාප්පා වන හම්සා (රලි) තුමාගේ පෙණහැල්ල සපා කෑ හින්ද නම් ගැහැණියද රසූලුල්ලාහ්ට හා සහාබාවරුන්ට නොයෙකුත් හිරිහැර කළ අයද සිටියහ. මොවුන් අපට කුමක් වේදැයි යන හිතියෙන් සිටින විට රසූල් (සල්) තුමාණන් ඔවුන්ට සමාව ලබා දුන්හ. මෙය අන්‍ය ආගමිකයන් ඉස්ලාම් වෙත ආකර්ෂණය වීමට පිටුවහලක් විය.

"ඔබව කවුරු අවමානයට ලක් කළේද, ඔබේ දුර්වලකම් හෙළිකර බැණ වැදුණෙහිද, ඔබ ඔහුගේ දුර්වලකම් සොයා බැණ නොවදිනු, මක්නිසාද යත්, ඔහුගේ ක්‍රියාවම ඔහුව අවමානයට ලක් කරයි." (අබූදවූද්)

අල්ලාහුතආලා අල් කුර්ආනයේ "ඔබේ යටත් වැසියන් වැරදි කරන විට දැඩි වචන වලින් බැණ වැදීම නොකළ යුතුය, ඔබගෙන් කෙනෙකු තව කෙනෙකුට නින්දා සහගත විදියට බැණ නොවදින්න. පහත් කොට නොසලකන්න. නපුරු හෝ විකට නාමයන්ගෙන් කතා නොකරන්න. විශ්වාස කිරීමෙන් පසු නපුරු හෝ විකට නාමයෙන් ඇමතීම මහා පවකි." (49:11) යැයි ද ප්‍රකාශ කර සිටියි.

"පවිත්‍ර මුඃමින්වරයෙකු අතු කොළ වලින් පිරී සෙවණ ලබාදෙන සශ්‍රීක ගසක් වැනිය" (අල් හදීස්)

අපි හැකිතාක් දුරට ඉහත කී ගුණාංගයන් වර්ධනය කර, පිරිපුන්වූ මුඃමින්වරයෙකු ලෙස ජීවත්වෙමු.

අභ්‍යාසය

1. මුස්ලිම්වරයෙකු ජීවිතයේ පිළිපැදිය යුතු ගුණාංගයන් නම් කරන්න.

2. විනයගරුක ඉස්ලාමීය සමාජයක් බිහිකරන්නේ කෙසේද ?

3. පරලොවෙහි ජය ලැබීමට කුමක් අවශ්‍ය වේද?

4. රසූල් (සල්) තුමාණන් මුඃමින්වරයෙකු සැසඳුවේ කුමකටද?

## 3.4 කාලය කළමනාකරණය

අල්ලාහුතආලා මෙම ලෝකය මවා මැවීම්වලට ක්‍රියාකාරීත්වය ද ලබාදුන්නේ ය. හිරු උදවී බැස යයි. පොළොව කැරකීමෙන් රෑ හා දවාල ඇතිවේ. මිනිස් ක්‍රියාකාරකම් ද මේ අනුව හැඩගැසේ. ස්වභාවයේ ක්‍රියාකාරකම්වලට මිනිසාට පටහැනි විය නොහැක.

මිනිසාගේ සියලු වැඩකටයුතු සාර්ථක විය යුතු නම්, කාලයේ කළමනාකරණය ඉතා වැදගත් ය.

ඉස්ලාම්, කාලයට මුල්තැනක් දෙන ආගමකි. කාලය අළුයම් උදව, පෙරවරුව, දහවල වශයෙන් වෙන් කරමින් අල් කුර්ආනය කාලය මත දිවුරා තිබීමෙන් ඊට සලසා දී තිබෙන ප්‍රමුඛත්වය ගෙනහැර දැක්වේ.

"ජීවිතය යනු අල්ලාහ් අපට දුන් දයාදයකි. එම දයාදය අප කෙසේ භාවිතා කළෙමුද යන්න පරලොවෙහි ප්‍රශ්න කිරීමට ලක්වන්නෙමු." යයි රසූල් (සල්) තුමාණන් පවසා ඇත.

කියාමත් දිනයේ ඕනෑම කෙනෙකු ප්‍රශ්න සතරකට පිළිතුරු සපයන තාක් සිටින තැනින් සෙලවෙන්නට බැරිය.

1. ස්වකීය ජීවිතය ගත කළේ කෙසේද ?
2. ස්වකීය තරුණ කාලය ගත කළේ කෙසේද?
3. ස්වකීය ධනය රැස් කළේ හා වැය කළේ කෙසේද?
4. තමා ලද දැනුමෙන් කොතරම් දුරට ක්‍රියාත්මක වීද? යන්නය.

මෙහි තරුණ කාලය හා ජීවිත කාලය වෙනස් කර දක්වා තිබීම අවධානයට ලක්විය යුතුයි. ජීවිතය යනු කාලය සමග එක්ව යන දෙයකි. එය නාස්ති කිරීම පුද්ගලික හා සමාජීය වශයෙන් මෙලොව, පරලොව ජීවිතයට පාඩුවකි. එම නිසා සෑම මුස්ලිම්වරයෙක්ම කාලය, ඉතා ප්‍රයෝජනවත්ව ගත කළ යුතුයි. මුස්ලිම්වරයකු ගත් කළ කාලය ඔහුගේ ජීවිතය වේ. "මම එක්තරා කණ්ඩායමක් දුටුවෙමි. ඔවුන් සිය ධනය කෙරෙහි දක්වනවාට වඩා සැලකිල්ල කාලය සඳහා දක්වති". යනුවෙන් හසනුල් බසරී (රහ්) තුමා සඳහන් කළේය. රෑ හා දවාල ඔබ කෙරේ ක්‍රියාත්මක වේ. එයින් ඔබ ක්‍රියාත්මකවන්න. "කාලය අසිපතක් වැනිය. ඔබ එයින් කැපිය යුතුයි. නැතිනම් එය ඔබව කපා දමනු ඇත." කාලය නාස්තියට ලක් කිරීම, අල්ලාහ්ගේ දයාදයන් නාස්තියට ලක් කිරීමකි.

'දවසක් උදවී එම දවසෙහි සුළු තරමින්වත් දියුණුවක් නැතිව මගේ ආයුෂය අඩු වේ නම්, ඒ වෙනුවෙන් දුක් වෙන තරමට මම වෙන දෙයකට දුක් නොවෙමියි' ඉබ්නු මස්ඌද් (රලි) තුමා, පැවසුවේය.

කාලය වේගයෙන් ගෙවමින් පවති. අල්ලාහුතආලා මේ නිසා අපට කාලය නිශ්චිත වූ සලාතය වැනි වගකීම් පවරා ඇත. එනම් නිශ්චිත වේලාවට සලාතය ඉටුකිරීමෙන් වෙනත් වගකීම් ද නිශ්චිත වේලාවටම ඉටුකළ හැකි වේ.

බුද්ධිමතෙක් කාලය කොටස් හතරකට බෙදගනී. එයින් කොටසකදී සිය පරමාධිපති වූ අල්ලාහ් සමග සම්බන්ධතා පවත්වයි. ඊළඟ කොටසෙහි ස්වයං ඇගයීමක යෙදෙයි. තෙවැනි කොටසෙහි අල්ලාහ්ගේ මැවීම් ගැන සිත මෙහෙයවයි. අවසාන කොටසෙහි තම ජීවිතයට අවශ්‍ය දෑ ඉටුකර ගනී. (ඉබ්නු හිබ්බාන්)

වේලාව සැළසුම් කරන විට එක් එක් අය, තමන්ගේ විවේකයට කොටස් වෙන් කර ගත යුතුයි. විවේක වේලාවන්වල ඉස්ලාම් අනුමත කර ඇති විනෝදාංශවල යෙදිය යුතුය.

වේලාව ප්‍රමාණවත් නොවේ, යනුවෙන් නොකියා තිබෙන වේලාව උපයෝගි කර ගත යුතුයි. "අල්ලාහ් මගේ අනුගාමිකයින්ගෙන් හිමිදිරියෙන්ම නින්දෙන් අවදිවන අයට ඔබ දයාව පිරිනමත්වා" (අහමද්) යයි නබි (සල්) තුමා ප්‍රාර්ථනා කළහ. එමනිසා උදෙන්ම අවදි වී තහජ්ජත් සලාතය ඉටුකර, ඒ සමඟ සුබ්හු සලාතය ද, ඉටුකර උත්සාහයෙන් එම දවස පටන් ගන්නා විට එදින කටයුතු සියල්ලම නිසියාකාරව ඉටුවේ.

සලාතය නියමිත වේලාවට ඉටුකිරීම, සෙල්ලම් කරන වේලාවට සෙල්ලම් කිරීම, ඉගෙන ගතයුතු වේලාවේ ඉගෙන ගැනීම, නින්දට යන වේලාවේ නිදාගැනීම යනුවෙන් එක් එක් වේලාවට අයත් කර්යයන් ඉටුකළ යුතුයි. එක් කාර්යකට මුළු වේලාවම යොදා ගැනීමට ඉඩ නොහැරිය යුතුය.

"ඉර බසින වේලාවට අසර් සලාතය ඉටු කරන කෙනෙකුගේ සලාතය මුනාෆික්වරයෙකුගේ සලාතය වේ." (මුස්ලිම්) යයි නබි (සල්) තුමාණන් පවසා ඇත. වේලාවට කළ යුතු දෑ එම වේලාවේම ඉටු කර අවසන් කළ යුතුය, යන්න මෙම හදීසියෙන් තහවුරු කර ඇත.

කාලය රන් හා සමානය යනුවෙන් කියනු ලැබේ. රන් නැතිවුනා නම් පසුව එය සොයා ලබාගත හැකිය. නමුත් අපගේ නාස්ති වූ වේලාව නැවත ලබාගත නොහැක.

කාලය ගෙවියනවාත් සමගම මිනිසාගේ ආයුෂද අඩු වන්නේ යයි හසනුල් බස්රි (රහ්) පවසා ඇත. "දිවා කාලයේ ඉටුකළ යුතු සමහර කාර්යයන් තිබේ. එය අල්ලාහ් රාත්‍රි කාලයේදී අනුමත නොකරයි. එසේම රාත්‍රි කාලයේ අල්ලාහ්ට ඉටුකළ යුතු යම් කාර්යයන් ද ඇත. එය අල්ලාහ් දිවා කාලයේ දී අනුමත නොකරයි, යනුවෙන් උමර්(රලි) තුමා පවසා ඇත.

"සූරා අස්ර්හි" මිනිසුන්ගේ ජයග්‍රහණය සඳහා වූ මග කුමක් ද? යනුවෙන් ඉතා කෙටියෙන් සඳහන් වේ.

ඉමාම් ෂාෆි (රහ්) තුමා, "මිනිසා කාලයේ මහිමය දැනගෙන එය උපයෝගි කර ගැනීමට අපොහොසත් වුවහොත් මහ පාඩුවකට මුහුණ පෑමට සිදුවේ. මිනිසා කාලය උපයෝගි කර ගත්තා නම් ඔහුගේ සුළු ආයුෂයෙන් පරලොවේ සෞභාග්‍ය සඳහා වූ මාර්ගයක් සලසා ගත හැකිය, යනුවෙන් පවසා ඇත. එම නිසා කුසල් රැස්කර ගැනීම සඳහා අපි කාලය හා වේලාව භාවිතා කර ගත යුතුය යනුවෙන් ද පැවසුවේය.

අයිස් කැට වෙළෙඳමෙහි යෙදෙන වෙළෙන්දෙකු දියවීමට පෙර ඒවා විකුණා ගත යුතුයි. මෙසේ කාලය ද නාස්ති වී යන්නට ඉඩ නොහැර එය යහපත් කාර්යයන් සඳහා යොදා ගන්නෙකු නියම මුස්ලිම්වරයෙකු වේ.

## 3.5 සුළු පව් හා මහා පව්

සුදු කෙළිය, මධ්‍යසාර භාවිතය, කේලම් කිව, ඕපදූප දෙඩීම, විකට නාම යෙදීම, අවමානයට ලක් කිරීම. ගණිකා වෘත්තියෙහි යෙදීම, අනුන්ට හිරිහැර කිරීම, සොරකම, මංකොල්ල කෑම, පොදු දේවලවලට හානි කිරීම, බොරු චෝදනා එල්ල කිරීම, කට කතා පැතිරවීම, මිනිසුන් අතර ආරවුල් ඇති කිරීම, අසභ්‍ය චිත්‍රපටි නැරඹීම, බොරු කීම යනාදී පව් කරන්නන් අල්ලාහ් ගේ කෝපයට ලක් වන්නෝ ය.

පරමාන්තයේ මෙම පව්කාරයින්ට ඉතා භයානක දඬුවම් ලැබෙනු ඇත. රසූල් (සල්) තුමාණන් මිඃරාජ් ගමනේදී මෙවන් පව්කාරයින්ට ලබාදුන් දඬුවම් සියැසින් දැක ඇත්තාහ. සමහරුන්ගේ දිව කතුරකින් කපා දමනු දුටු රසූල් (සල්) තුමාණන් ඒ ගැන විමසූ විට. 'ඔවුන් මෙලොවෙදී අනුන්ට දේශනා කළා මිසක්, ක්‍රියාකර පෙන්වූයේ නැත' යයි පැවසූහ.

"අල්ලාහ්ට ආදේශකයන් තැබීම, දෙමව්පියන්ට නොසැලකීම, මිනිස් ඝාතනය, බොරු දිවුරුම් දීම යනාදිය මහා පව් වේ" (බුහාරි මුස්ලිම්) මෙවැනි මහා පව් කිරීම සඳහා අප කාලය යොදා ගැනීමෙන් වැළකිය යුතුයි. අල්ලාහ් හා ඔහුගේ රසූල් යම් දෙයක් අවවාදයට ලක් කළ එවන් දෑ වලින් අපද ඈත්විය යුතුයි. එවෙනි පව් වලින් මිදීම සඳහා තම්බාව මඟින් සමාව අයදිය යුතුයි.

විශ්වාස වන්තයකයෙකු මෙවන් පව්වල නිරතවන්නේ නැත. පොදුවේ ගත් කළ පව් හා අයහපත් දේවල් මිනිස් හදවතින් උපත ලබන්නේය, යන්න නබි (සල්) තුමාණන්ගේ අදහසයි. "මිනිස් සිරුරෙහි එක් අවයවයක් ඇත. එය යහපත් වේ නම්, මුළු සිරුරම යහපත් වේ. එය නරක් වී යයි නම් මුළු සිරුරම නරක්වේ. දැනගන්න එය තමා හදවත යයි" රසූල් (සල්) තුමාණන් පවසා ඇති අතර බරපතල ලෙස අවවාද කර ඇත.

හදවත යහමගට හැරවීමෙන් කුසල් රැස්කර ගත හැකිවේ. එවිට අල්ලාහ් හා ඇති බැඳීමද වැඩිවේ.

අභ්‍යාසය

1. පහත සඳහන් වාක්‍යයන් නිවැරදි නම් (✓) යන ලකුණද, වැරදි නම් (X) යන ලකුණ ද යොදන්න.

   i. ඊමානය, කාලය සමග සම්බන්ධතාවයක් දක්වයි. ( )
   ii. ඉස්ලාම් කාලයෙහි වැදගත්කම මනාව කියාපාන ආගමකි. ( )
   iii. කාලය වගී පහකට බෙදිය හැකිය. ( )
   iv. "අසර්" යන පදෙහි තේරුම උදව්ව යන්නය. ( )
   v. පරමාන්තයෙහි සියළු දෙනා අනිවාර්යයෙන්ම ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුයි. ( )
   vi. නුවණැත්තා කාලය කොටස් හතරකට බෙදා ගනී. ( )
   vii. කාලය ගෙවීමත් සමග මිනිසාගේ ආයුෂත් වැඩිවේ. ( )
   viii. සොරකම් කිරීම මහා පවකි. ( )
   ix. ඊමානය පරිපූර්ණ තැනැත්තෙකු මහා පව්වල නිරත වන්නේය. ( )
   x. කාලය රන් හා සමානය. ( )

2. කෙටි පිළිතුරු සපයන්න.

   1. අල්ලාහ් වේලාව ගැන දිවුරන සූරාව කුමක් ද?
   2. කාලයෙහි කොටස් මොනවා ද ?
   3. පරමාන්තයේදී මිනිසා පිළිතුරු සැපයිය යුතු අනිවාර්ය ප්‍රශ්න මොනවා ද?
   4. ඊමානයෙහි පිරිසිදුභාවය කෙසේ හඳුනා ගන්නෙමු ද?